# "මාගෙ පුතුට මල් යහන සදනනේ"



"ආදරය එක් අතකින් සිහිල් සුළං රැල්ලක් වැන්න. වන තීරයක් හරහා ඇදී එන සිහිල් පවන් පොද එම වන පෙතෙහි රූස්ස අතු ඉති මෙන්ම කුඩා තුරු පත්‍ර ශාඛා ද තම සෙනෙහසෙහි දෑත දිගු කර එක් වන් දයාවකින් වැළඳ ගනී. එසේ වැළඳ තුරු පත් චාමරයෙන් මිහිකතටත් සොබා දහමටත් පවන් සලන්නට උගන්වයි. ආදරයත් එසේමය."
(සංසාර දර්ශන, ධර්මසිරි ගමගේ, 1991)

ආදරය ගැන කියවෙන මේ සුන්දර සිතුවිලි සමුදාය, ශ්‍රී ලංකා මාතාවගේ අගනා පුත්‍ර රත්නයක් වූ, මේ වන විට දැයෙන් සමු ගෙන සිටියද සිය නාමය බොහෝ දෙනාගේ හදවත්වල සනිටුහන් වී තිබෙන්නට තරම් මහගු මෙහෙවරක් කළ ධර්මසිරි ගමගේ නම් වූ සොඳුරු නිර්මාණ කරුවාගේය.

සාහිත්‍ය නිර්මාණ විෂයයෙහි මෙන්ම පුවත්පත් කලාවෙහි ද දස්කම් පෑ මෙතුමා, ' පැමිණි දුක් පැණි රසයි' යන අපේ ජනවහරේ එන ප්‍රකට කියමන ද හිස් මුදුනින්ම පිළිගනිමින් ඉදිරියට එන කවර අභියෝගයක් වුව ජයගනිමින් ආදර්ශවත් දිවිපෙවෙතක් ගත කළ කෙනෙකි. පසුගිය දා (ඔක්තෝබර් 4 දා) එතුමාගේ ජන්ම දිනය ද සිහිපත් කරමින් පැවැත්වුණ ගුණානුස්මරණ උත්සවයකදී විශේෂයෙන් පාසල් දරුදැරියන්ට එවැනි චරිතයක විශේෂත්වය හඳුන්වාදීමේ අවස්ථාව සැලසුණි.

ගමගේ මහතා අතින් නිර්මාණය වූ චිත්‍රපට ගී හා වෙනත් ගීත සමූහයක් වෙයි. එම ගීත රචනාවල විශේෂත්වයක් වන්නේ ජීවිතයක සොඳුරු බව, ආදරය, සෙනෙහස, දෙමාපිය-දරු සබඳතා, මෙන්ම මිනිස් හදවත්වල පහළ වන සංවේදී හැඟීම් ද ඒවාට විෂය වී තිබීමයි. සිංහල චිත්‍රපට අතර රසවත්, නිර්මාණාත්මක, සුන්දර දරු නැළවිලි ගීතයක් රැගත් චිත්‍රපටයක් ලෙස අදත් අපට සිහිපත් වන 'පුංචි බබා' චිත්‍රපටය ධර්මසිරි ගමගේ මහතාගේ නිර්මාණ කුසලතාව එළිදැක්වීමට මග පෑදූ කෘතියකි. මහාචාර්ය සුනිල් ආරියරත්න සලකන පරිදි, පිරිමි මුවකින් ගැයෙන එකම දරු නැළවිලි ගීය මෙම චිත්‍රපටයෙහි ඇතුළත් වන නැළවිලි ගීතය විය හැකිය. ධර්මසිරි ගමගේ නම් වූ සොඳුරු නිර්මාණ කරුවාගේ සිත තුළ උපන් සැබෑ දරු සෙනෙහස ඒ හා මුසු වූ සංවේදී හැඟීම් තුළින් මතු කර දැක්වෙන මෙම ගීතය එදා මෙන්ම අදත් රසික හදවත් තුළ නොමැකී පවතින්නකි.

"මාගෙ පුතුට මල් - යහන සදන්නේ
දෑස සිහින වැල් පාවී එන්නේ
රෝස කැලේකින් ඇහිලූ වැන්නේ
මට මේ කුමරුන් කව්දෝ දුන්නේ"

සිසිර සේනාරත්න නම් වූ ප්‍රකට ගායකයාගේ මිහිරි හඬින් ගැයෙන මෙම ගීතය කාගේ වුව දෙසවන් මෙන්ම සිත්සතන් ද ආදරයෙන්, සෙනෙහසින් මෙන්ම සංවේදී හැඟීම්වලින් ද පුරවා ලන්නකි. " මවගෙ ළමැද ලේ - කිරට පෙරෙන්නේ, ඒ කිරි සුවඳයි - ලොව පවතින්නේ" ලෝකයක පැවැත්මට මූලික වන දරු උපත, දරු සෙනෙහස, මවකගේ සිරුරේ ලේ දහරාව දරුවා වෙනුවෙන්ම කිරට හැරීම යනාදී සංකල්පනා පද මාලාවෙන් මෙන්ම රසවත්, යෝග්‍ය ස්වර රටාවකින් ද උද්දීපනය කෙරෙමින් ගැයෙන මෙම අපූරු ගීතය ධර්මසිරි ගමගේ මහතාගේ හැඟීම් සමුදාය පොදු මිනිස් හැඟීමක් බවට පත් කරවයි. "අම්ම කියාලයි බහ තෝරන්නේ, ඒ සුදු අම්මා කොහෙදෝ ඉන්නේ" යනුවෙන් ගැයෙද්දී සෑම සංවේදී සිතකටම එම වින්දනය නොමඳව ලැබෙනු ඇත.

ධර්මසිරි ගමගේ කලාකරුවා අතින් ලියවුණ ගීත අතර දරුවන් විෂය කරගත් නිර්මාණ කිහිපයක්ම වෙයි.

"පුංචි පුතා මගෙ ඉස්කෝලේ ගිය
මුල්ම දවස අද වේ
බුලත් අතක් දී ගුරුතුමියට වැඳ
මා තනි කළ මොහොතේ

අද සිට පුතුනේ හොඳින් ඉගෙනගෙන
මතු යම් දවසක වියතකු වනු මැන
සිතින් පැතුම් පතලා
ඔහු පන්තියෙ තියලා -----"

යන ගීතයට ඇතුළත් වන අත්දැකීම කොතරම් නම් මව්වරුන්ට, පියවරුන්ට අදාළ වේද යන්න සිතාගැනීම අපහසු නොවේ. තම සිඟිති දුව හෝ පුතා තමන්ගේ සෙවණෙන් තාවකාලිකව හෝ බැහැරට යන මුල්ම දිනයේ මව්පියන් තුළ පහළ වනුයේ මිශ්‍ර හැඟීම් සමුදායකි. විවාහ දිවියට එළඹෙන යුවතිපති දෙදෙනකු අනතුරුව අපේක්ෂා කරනුයේ දරු සම්පතකි. තමන්ට ලැබෙන දියණිය හෝ පුතා පාසල් යවා අධ්‍යාපනය ලබා දී එමගින් උසස් පුද්ගලයකු කරවීමේ චේතනාව ද ඒ හා බැඳී පවතින්නකි. ඒ අනුව සිය දරු සිඟිත්තා මුලින්ම පාසල් යන දිනය සිහිපත් කරමින් ඒ හා බද්ධ වූ සිතුම් පැතුම් සමුදායක් සුන්දර පද පෙළකට ගළපාගෙන ඇති ආකාරය අපූරුය. මෙවන් ගී සංකල්පනා සුන්දර මනසකින් හෙබි සංවේදී කලාකරුවකු තුළම පහළ වන බව අමුතුවෙන් කිව යුතු නොවේ.

දරුවන් පිළිබඳව මනෝවිද්‍යාත්මක ඇසකින් බැලීමට ඇතැම් වැඩිහිටියන් අසමත් වන අයුරු අපට දැකගන්නට ලැබෙන අවස්ථා විරල නොවේ. දරුවකුගේ සැබෑ වර්ධනය කායික මෙන්ම මානසික අතින් ද සමබරව සිදු විය යුතුය. අතීතයේදී ගැමි පරිසරය තුළ නිදහසේ හැසිරෙමින් සිය ළමා දිවිය අර්ථවත් ලෙස ගත කළ දරුවන් ලැබූ එම මහගු අවස්ථාව අද බොහෝ දරුවන්ට නොලැබෙන බව අපි දනිමු. නාගරික පරිසරයෙහි දිවි ගෙවන දරුවකු පොතපතින් ලබන දැනුමට අමතරව බාහිර ක්‍රියාකාරකම්වලින් ලබාගත හැකි දැනුම ද ඔහුගේ හෝ ඇයගේ අනාගතය සරුසාර කිරීමට අත්‍යවශ්‍ය වනු ඇත. පාසල් පරිසරයෙහි ඒ සඳහා ලැබෙන මඳ ඉඩකඩ ගෙදර පරිසරයේදී හෝ පුරවා ලන්නට දෙමාපිය වැඩිහිටියන් උත්සුක විය යුතු බව ධර්මසිරි ගමගේ නිර්මාණ කරුවා අවබෝධ කරගෙන සිටි ආකාරයට හොඳ නිදසුනකි ඔහු අතින් ලියවුණ, "බණින්නෙපා පොඩි දෝණිට, ගහන්නෙපා - හාල් මිටක් දුව අරගෙන ඇත්තේ - සෙල්ලම් බත් උයන්නයි ----" නම් ගීතය.

තමා සැබෑ අත්දැකීමක් ඇසුරෙන් මෙම ගීතය නිර්මාණය කරන්නට යොමු වූ බව එතුමා වරක් ප්‍රකාශ කළ බව මගේ මතකයට නැගෙයි. ගැමි දරුවන් ලෙස අප සෙසු දරුදැරියන් හා එක්ව "කෝම්පිට්ටු ඉදීයෝ----" කියමින් වැලිබත් පිසූ අයුරු සිහිපත් වන විට මෙම ගීතයෙහි අර්ථවත් බව තවත් තීව්‍ර වෙයි. දෙමාපිය වැඩිහිටියන් අනුකරණය කිරීම කුඩා දරුවන්ට ආවේණික වූ ස්වභාවයකි. සිය මව්වරුන් බත් උයද්දී එය දකින පුංචි දරු දැරියන් ඒ අනුව තමන් ද අනුකරණාත්මක ලෙස ක්‍රියාකරන්නට යොමු වීම ස්වාභාවිකය. දරුවන්ට ක්‍රීඩා කරන්නට යයි කියා වළං පොඩි මිලට ගෙන දෙන මව්පියන් තම කුඩා දියණිය ඒවා යොදාගෙන සෙල්ලම් බත් උයන්නට නිවසේ මුළුතැන්ගෙයින් සහල් ටිකක් ගැනීම කිසිසේත්ම චෝදනාවට ලක් කළ යුතු නොවේ.






සම්මානිත මහාචාර්ය
කුසුමා කරුණාරත්න

එපමණක් නොව, මෙම ගීතයෙන් ගමගේ මහතා පවසන තවත් බොහෝ දේ ඇත. පුංචි දියණිය හිතුමතයට සහල් ටිකක් ගෙන බත් උයන්නට යොමු වීමට අමතරව, එලෙසට පිසගත් සෙල්ලම් බත්වලින් ටිකක් මව්පියන්ට ද පිළිගැන්වීම ද සැබවින්ම සුන්දර අවස්ථාවකි. මෙම ළමා ප්‍රතිචාර මගින් පවුලක් තුළ ගොඩනැගෙන ආදරය, සෙනෙහස හා දෙමාපිය--දරු අන්‍යෝන්‍ය සම්බන්ධතා ද ධර්මසිරි ගමගේ නිර්මාණ කරුවා අපේක්ෂා කළ දේය. පවුලක් ශක්තිමත්ව ගොඩනැගෙමින් ඉදිරියට යාමට නම් නිවස තුළ පරිසරය සොඳුරු බවෙන් යුක්ත විය යුතුය, සාමකාමී විය යුතුය. දරු සුරතල් බලන්නට දෙමාපියෝ, නිසි කලට නිසි අවස්ථාවට යොමු විය යුතුය. පුංචි සිත් තුළ මතු වන ආශාවන් හා අපේක්ෂාවන් සිඳලන්නට ඔවුහු යොමු නොවිය යුතු වෙති. තමන්ම මිලට ගෙන දුන් පුංචි වළන් පොඩිවල සෙල්ලම් බත් උයන්නටත්, එසේ උයා දෙමාපියන්ට කවන්නටත් ආශාවෙන් හාල් මිටක් ගත්තාට පොඩි දියණියට සැරවැර කිරීම නුසුදුසු බව මෙම නිර්මාණ කරුවා දයාවෙන් යුතුව පවසන්නේ සමස්ත වැඩිහිටි පරපුරටමය. ධර්මසිරි ගමගේ මහතා සිය ජීවිතයේ බොහෝ අවස්ථාවන් දරුවන්ගේ යහපත වෙනුවෙන්, පවුල් සම්බන්ධතා තර කිරීම වෙනුවෙන් හා වෙනත් සාධනීය සමාජ ආකල්ප දැක්වීම වෙනුවෙන් ද කැප කළ කෙනෙකි.

සිය ජීවිතය පුරාම තම දෙමාපියන්, බිරිඳ හා දරුවන් වෙනුවෙන් නොමඳ කැප කිරීම් කරන්නට යෙදුණ මෙතුමා මව්ගුණ අළලා ලියා ඇති සුප්‍රකට ගීතය එය ඇතුළත් 'යස ඉසුරු' චිත්‍රපටයේ විශේෂත්වය ද මතු කර ලන්නකි. පූජ්‍ය අගලකඩ සිරිසුමන හිමියන් පවසන පරිදි, ධර්මසිරි ගමගේ මහතාණන් අතින් 'පූජා' චිත්‍රපටය සඳහා ලියවුණ "දරු දුක උහුලා ----- -" යන ගීතය සිංහලයෙන් ලියවුණ පියගුණ ගී අතර සිළුමිණක් වන්නා සේම 'යස ඉසුරු' චිත්‍රපටයේ අන්තර්ගත "අම්මාවරුනේ ---" යන ගීතය මව්ගුණ ගී අතර සිළුමිණක් ලෙස හැඳින්වීම ද යුක්තියුක්තය.

"දරුවන්ගේ දුක් කඳුළු දකින දා - සුරලොව සිට අත පා - ඒ කඳුලැලි පිසිනා -----" මව්වරුන්ගේ ගුණ කදම්බය ලොවටම කියා පාමින් මෙලෙසට රචනා කළ ගීතය මගින් මතු කෙරෙන හැඟීම්, දැනීම් හා ගෞරව ප්‍රණාමය සිය මව්තුමිය වෙනුවෙන් ද පුද කළ විශේෂ පුද්ගලයකු බවට ධර්මසිරි ගමගේ මහතා පත් වෙයි.

පූජ්‍ය අගලකඩ සිරිසුමන හිමියන් නිවැරදි ලෙස ප්‍රකාශ කරන්නට යෙදුණ පරිදි 'අම්මාවරුනේ' නම් ගීතය සැබවින්ම සිංහල මව්ගුණ ගී අතර සිළුමිණක්ම වන්නේය. වයස් භේදයකින් තොරව, දුකට පත් කවර පුද්ගලයෙකු වුව, තමන්ට දුකක් වේදනාවක් දැනුණ විට නිරායාසයෙන්ම හඬ ගා කියන වචනය අන් කිසිවක් නොව, 'අම්මේ' යන්නයි. දැඩි දුකකදී, වේදනාවකදී, 'බුදු අම්මේ' යනුවෙන් අප කාගේ වුව මුවින් ගිලිහෙන්නේ අපේ ආදරණීය අම්මා, 'බුදු අම්මා' ම වන නිසාය. ගමගේ මහතා සිය ගීතයෙහි කිහිප වතාවකදීම, "සම්මා සම්බුදු අම්මාවරුනේ", " ඒ දුක දන්නා අම්මාවරුමයි යම් මතු දවසක බුදු වන්නේ", "සංසාරේ මතු බුදු වන්නේ" වැනි යෙදුම් මගින් පළ කර සිටින්නේ ද මෙලොව ජීවත් වන කවර පුද්ගලයකුට වුව තමා සමීපයෙන්ම සිටින, එසේ සිටිතැයි අපේක්ෂා කරන සිය ආදරණීය මෑණියන්ගේ උත්කෘෂ්ට ගුණය හා වටිනාකමයි.

කවර පුද්ගලයකු හෝ මෙලොවට බිහි කිරීමට මුල් වන මව මෙන්ම පියා ද යහපත් මනසකින් යුත් කාගේ වුව ජීවිතය හා සමාන වටිනා අය ලෙස සැලකෙයි. ධර්මසිරි ගමගේ කලාකරුවාගේ රසවත් මෙන්ම අර්ථපූර්ණ වූ ද ගීතයෙන් ඔප්නැංවුණ 'පූජා' චිත්‍රපටය ද වැඩිදෙනාගේ සිත්සතන් තුළ සනිටුහන් වී තිබීමට එම ගීතය බෙහෙවින් හේතු සාධක වූ බවට සැකයක් නැත. 'පූජා' චිත්‍රපටයේ පියාගේ චරිතය නිරූපණය කරන, අප අතර සිටි අතිදක්ෂ, ජ්‍යෙෂ්ඨ නළුවකු වූ ජෝ අබේවික්‍රමගේ රංගනයෙහි විශේෂතම අවස්ථාව හා බද්ධ වූ,"දරු දුක උසුලා - තනිව වැළපෙනා - බුදු බව ලබනා - පියවරු වෙසෙනා ----" යන ගීතය ධර්මසිරි ගමගේ කලාකරුවා අතින් නිර්මිත උසස්ම ගීතයක් ලෙස හැඳින්වීම වරදක් නැත. "මව් ඇති දාටත් සෙනෙහස පුදනා - මව් නැති දාටත් තුරුළේ රකිනා - බුදු බව ලබනා පියවරු වෙසෙනා".

වර්තමාන සමාජය තුළ පියවරුන්ගේ ප්‍රතිරූපය කැලැල් කරන ඇතැම් චරිත ගැන අපට අසන්නට ලැබුණත් සාමාන්‍ය මිනිස් ස්වාභාවය අනුව පියකු යනු කවුරුදැයි අපට කියා පාන, අතිශය සංවේදී මෙන්ම අර්ථවත් වූ ද මෙම පද පෙළ ශ්‍රවණය කරන කා තුළ වුව පහන් සංවේගයක් දනවයි.

*ළබන කලාපය හා බැඳෙයි*